සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය - I** | **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැ.යු. :-

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අකුරෙන් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණු කරන්න.

---

01. නිරිස , නිරිගරිස යන ස්වර ඛණ්ඩ අයත් වන රාගය කුමක් ද?
    (1) බිලාවල් (2) යමන් (3) භෛරවී (4) භූපාලී

02. ඖඩව ජාතී රාගයකි,
    (1) බිලාවල් රාගය (2) යමන් රාගය (3) භූපාලි රාගය (4) භෛරවී රාගය

03. තබ්ලා වාදනයේ දී දෑතම උපයෝගී කර ගනිමින් වාදනය කරන අක්ෂර 02 ක කුමක් ද?
    (1) ධ, ධිං (2) ධ, ගෙ (3) තිං, තා (4) ධිං, ත

04. ආදරය, ශෘංගාරය මත පදනම්ව නිර්මාණය වූ උතුරු ඉන්දීය ගීත ශෛලියකි,
    (1) ඛ්‍යාල් ගායන ශෛලිය (2) භජන් ගායන ශෛලිය
    (3) ධ්‍රැපද් ගායන ශෛලිය (4) ගසල් ගායන ශෛලිය

05. සිනමා සංගීතයට Key Board (ඕගන්) වාදනය එක් කිරීමේ ගෞරවය හිමි වන්නේ පහත දැක්වෙන අයගෙන් කාහටද?
    (1) මොහොමඩ් ගවුස් ශූරීන්ටය. (2) ආර්. මුත්තුස්සාමි ශූරීන්ටය.
    (3) බී.ඇස්. පෙරේරා ශූරීන්ටය. (4) ප්‍රේමසිරි කේමදාස ශූරීන්ටය.

06. නාඩගම් ගී ඇසුරින් නිර්මාණය වූ ගීත පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
    (1) දඩිකළ මාතා ගීතය / කඳුලු හෙලා නැබියට ගීතය / ආලවෙලාපියසේ පටන් ගීතය
    (2) නන් සිරින් වොරැදි ගීතය / ඉර සඳ දෙවියනි ගීතය / ලප නොමවන් සඳ ගීතය
    (3) මුහුදු පතුල යට ඉඳලා ගීතය / තැර ඉස්කි තැර ගීතය / ඕලු පිපීලා ගීතය
    (4) අර බලන්න ඉර ගීතය / බුදු තුල් ගුණැති ගීතය / හඳ හාවුනේ හඳේ ගීතය

07. සැළලිහිණි සංදේශයේ ඇතුළත් පද්‍ය වැඩි ප්‍රමාණයක් ගැයෙන්නේ කුමන විරිතට ද?
    (1) දෙතිස්මත් විරිතටය. (2) සොළොස්මත් විරිතටය.
    (3) සූවිසිමත් විරිතටය. (4) සමුද්‍රඝෝෂ විරිතටය.

08. 𝄋 යන සංකේතයෙන් කියැවෙන්නේ කුමක් ද?
    (1) මුලින් මෙම සංකේතය යොදා තිබූ ස්වර ඛණ්ඩය වෙත නැවත යා යුතු බවයි.
    (2) ගීතය මින් අවසාන වන බවයි.
    (3) දෙවරක් වැයිය යුතු බවයි.
    (4) විරාමයක් ඇති බවයි.

09. ''වයලීනයේ නාදය හා මැන්ඩලීනයේ නාදය එකිනෙකට වෙනස් වූ නාදයන්ය.'' මෙය නාදයේ කුමන ගුණයද?
(1) අඩු වැඩි බවයි. (2) ධ්වනි ගුණය. (3) තාරතාවයයි. (4) සංඛ්‍යාතයයි.

10. ශ්‍රව්‍ය දෘශ්‍ය යන අංශ දෙකම එකවර ගබඩා කර ගත හැකි නවීනතම මෙවලම් මොනවා ද?
(1) කැසට් පටය (2) ස්පුල් (3) දළසේයා පට (4) VCD, DVD තැටි

11. වර්තමානයේ සංගීත නිර්මාණයේ දී හා සංගීත පටිගත කිරීමේ කාර්යයේ දී භාවිත වන නවීනතම තාක්‍ෂණ ක්‍රමය කුමක් ද?
(1) MIDI ක්‍රමය (2) Stereo ක්‍රමය (3) Mono ක්‍රමය (4) Digital ක්‍රමය

- **12 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**

| මාත්‍රා | 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
|---|---|---|---|---|
| ඨේකාව | ධා ධිං - | ධා ධා ධිං - | තා තිං - | ධා ධා ධිං - |
| තාල සංඥා | x | 2 | 0 | 3 |

12. ඉහත තාලයේ නම කුමක් ද?
(1) ජප් තාලය (2) දීප්චන්දි (3) කෙහෙර්වා (4) ලාවනී

13. එම තාලයට සමානව වැයෙන දේශීය තිත් රූපය වනුයේ කුමක් ද?
(1) සුළු මහ දෙතිත (2) මැදුම් මහ දෙතිත
(3) මැදුම් මහ දෙතිත (4) මහ තනි තිත

14. එම තාලපදය අවර්ත දෙකක් වාදනය වූ විට ලැබෙන මාත්‍රා සංඛ්‍යාව කීයද?
(1) 28 කි. (2) 24 කි. (3) 14 කි. (4) 56 කි.

15. මෙම තාලයට අනුව ගැයෙන ගී පාදය කුමක් ද?
(1) රත්නදීප ජන්ම භූමි (2) සැළලිහිණි කොවුල් හඬ
(3) රන්මලක් ලෙස දෙව්බඹුන් (4) පෙරදිග මුතු ඇටයයි මේ


16. තිර්ලානා, පසන්, චාපු යනු තාල පද
(1) මෘදංගයෙන් වයනු ලබන තාලය පදයි.
(2) තබ්ලාවෙන් වයනු ලබන තබ්ලා අක්ෂරයි.
(3) මද්දලයෙන් වාදනය කරනු ලබන තාලය පදයි.
(4) පහතරට බෙරයෙන් වයනු ලබන තාල පදයි.

17. ''ගල්ලෙන බිඳලා.....'' මෙම ගීතය අයත් වන නාට්‍ය ශෛලිය කුමක් ද?
(1) නාඩගම් ශෛලිය (2) නූර්ති ශෛලිය (3) කෝලම් ශෛලිය (4) නවනාට්‍යය ශෛලිය

18. සබරගමු නැටුම් සම්ප්‍රදායේ එන වන්නමක කොටස් මොනවා ද?
(1) තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්වයි.
(2) තානම, කවිය, කලාසම, අඩව්වයි.
(3) තානම, කවිය, ඉරට්ටියයි.
(4) තානම, කවිය, ඉරට්ටිය, අඩව්වයි.

19. ජිං / ජිම්කිට / තත් / කිටි තක මෙය වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) දවුල (2) පහතරට බෙරය (3) තම්මැට්ටම (4) ගැටබෙරය

20. භූපාලි, යමන් යන රාග දෙකටම පොදු වූ ලක්‍ෂණය කුමක් ද?
(1) රාග දෙකේම වාදී සංවාදී සමාන වීම.
(2) ආරෝහණ, අවරෝහණ සමාන වීම.
(3) රාග දෙකේම ගායන සමය රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ වීම.
(4) රාග දෙකේම තීව්‍ර මධ්‍යසමය යෙදීම.

21. 


ඉහත රූපයේ සඳහන් බටනලාවේ 1, 2, 3 සහ 6 යන සිදුරු වසා වාදනය කළවිට ලැබෙන ස්වරය කුමක් ද?

(1) ධෛවතය (2) සඩ්ජය (3) මධ්‍යමය (4) නිශාදය

22. බටහිර සංගීතයේ දී තාල (Time Signature) හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(1) Scale එක නමිනි. (2) ස්වරයේ නමිනි.
(3) තාලයේ නමිනි. (4) මාත්‍රා සංඛ්‍යාවේ නමිනි.

23. 1992 දී 'මනි රත්නම්' විසින් අධ්‍යක්ෂණය කරන ලද 'රෝජා' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කරන ලද ඉන්දීය සංගීතඥයා කවුද?

(1) සෝනු නිසම්ය (2) ඒ.ආර්. රහ්මන්ය (3) ජග්ජිත් සිංග්ය (4) පංකාජ් උදාස්ය

- **පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ නාට්‍ය සම්ප්‍රදායන්ට අයත් තොරතුරු කිහිපයකි.**

A සබේ විදානේ විසින් නාට්‍යයේ චරිත හඳුන්වා දෙයි.
B පහත රට බෙරය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනේ.
C උත්තර භාරතීය රාගධාරී සංගීතය ආශ්‍රය කර ගනිමින් මිහිරි ගීත නිර්මාණය කර තිබේ.
D උරුට්ටුව නම් කොටසක් ගීතවල අන්තර්ගත වේ.
E සියලුම චරිත වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදේ.
F ගීත තුළ තාලයෙන් තොරව ගැයෙන දොහොරාව නම් කොටසක් ඇතුළත්ව තිබේ.
G මද්දලය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගනී.

- **24 - 26 දක්වා ප්‍රශ්න වලට ඉහත තොරතුරු ඇතුළත් කර ගනිමින් පිළිතුරු සපයන්න.**

24. ඉහත තොරතුරු වලට අනුව කෝලම් රංග සම්ප්‍රදායට අයත් තොරතුරු ඇතුළත් අක්ෂර මොනවා ද?

(1) ACF (2) ABE (3) ABD (4) DEC

25. නූර්ති රංග සම්ප්‍රදායට අයත් වන තොරතුරු ඇතුළත් අක්ෂර මොනවා ද?

(1) BC (2) DF (3) AC (4) CF

26. නාඩගම් රංග සම්ප්‍රදායේ තොරතුරු ඇතුළත් අක්ෂර මොනවා ද?

(1) DG (2) FG (3) AD (4) BC

27. $\frac{6}{8}$ යනුවෙන් සඳහන් Time Signature (තාලය) හින්දුස්ථානී තාල පද්ධතියේ සමාන වන තාලය කුමක්ද?

(1) ජප් තාලයට (2) ත්‍රිතාලයට (3) බෙම්ටො තාලයට (4) ධාධරා තාලයට

28. පරිගණකය මගින් දත්ත විශාල ප්‍රමාණයක් ගබඩා කළ හැකි නවීනතම තැටි වර්ගය කුමක් ද?

(1) DVD (2) VCD (3) CD (4) Blue Rey

- **දේශීය සංගීත උන්නතිය වෙනුවෙන් කැප වූ සංගීතඥයන් කිහිප දෙනෙකුගේ තොරතුරු පහත ඇතුළත් වේ. එම තොරතුරු ඇසුරින් 29 සිට 31 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 'ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය' නම් කෘතය රචනා කිරීම.
B මල්සරා බැල්ම හෙලා / සස්සඳ සස්සඳ නම් ගීත නිර්මාණය කිරීම.
C මේ අවුරුදු කාලේ / ගම අවුලක්ඥං යන ගීත නිර්මාණය කිරීම.
D 'දෑතට වලලු' නම් ගීතය නිර්මාණය කිරීම.

29. සී.ද. ඇස්. කුලතිලක මහතා සම්බන්ධ තොරතුරු අක්ෂර දෙක කුමක් ද?

(1) AD (2) BC (3) CD (4) AB

30. ලයනල් රංවල මහතා සම්බන්ධ තොරතුරු ඇතුළත් අක්ෂරය කුමක් ද?

(1) A (2) C (3) B (4) D

31. රෝහණ බැද්දගේ මහතා සම්බන්ධ තොරතුරු ඇතුළත් අක්ෂරය කුමක් ද?

(1) D (2) C (3) B (4) A

32. ලාංකීය සිංහල පළමු ඔපෙරාව වශයෙන් හඳුන්වන්නේ කුමක් ද?

(1) දෙපානෝ (2) අග්නි (3) කරදිය (4) හංසවිල

33. ගසල් ගායන ශෛලිය ඇසුරු කොට ගනිමින් නිර්මාණය වූ සරල ගීතය කුමක් ද?

(1) ගමේ ගොඩේ සිදාදියේ ගීතය (2) හාරිච්චි බෝරිච්චි ගීතය

(3) සැන්දෑ අහසේ ගීතය (4) මාරම්බරී කෝලවී ගීතය

34. සු | නිල් | වන් නු | වන් | යු ග මෙම ගීතය ආරම්භ වන්නේ කුමන ග්‍රහයෙන් ද?

(1) සමග්‍රහයෙනි. (2) අවග්‍රහයෙනි. (3) විෂමග්‍රහයෙනි. (4) අනුග්‍රහයෙනි.

35. 'වෙසක් කැකුළු අතු අග හිඳ' මෙම ගී පාදය නිවැරදි ලෙස ප්‍රස්තාර කරන ලද පිළිතුර කුමක් ද?

(1) <u>වෙසක්</u> <u>කැකුළු</u> | <u>අතුඅ</u> <u>ගහිඳ</u> (2) වෙසක් | කැකුළු | අතුඅ | ගහිඳ

(3) වෙස | ක්කැකුළු | අතු | අඟහිඳ (4) වෙසක්කැ | කුළු අතු | අඟ හිඳ

36. | සසරිරි | ගම | සරිගම | පධප | මෙම ගී පාදය පංචම භාවයෙන් ලියූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) | ප ප ධ ධ | නි ස̇ | ප ධ නි ස | රි̇ ග̇ රි̇ |

(2) | ප ප ධ ධ | <u>නි</u> ස̇ | ප ධ <u>නි</u> ස | රි̇ ග̇ රි̇ |

(3) | ප ප <u>ධ</u> <u>ධ</u> | නි ස̇ | ප <u>ධ</u> <u>නි</u> ස | රි̇ ග̇ රි̇ |

(4) | ප ප <u>ධ</u> <u>ධ</u> | <u>නි</u> ස̇ | ප <u>ධ</u> <u>නි</u> ස | රි̇ <u>ග̇</u> රි̇ |

37. වාදක මණ්ඩලයක සුෂිර භාණ්ඩ වැඩි ප්‍රමාණයක් සහිත සංගීත සම්ප්‍රදාය කුමක් ද?

(1) පෙරදිග සම්ප්‍රදාය (2) අපරදිග සම්ප්‍රදාය (3) දේශීය සම්ප්‍රදාය (4) නූර්ති සම්ප්‍රදාය

38. ''රස ආහාර කවලා......'' යන ගීතය නිර්මාණයේ දී ඇසුරු කර ඇති ගායන සම්ප්‍රදාය කුමක් ද?

(1) නූර්ති ගායනා ශෛලිය (2) කපිරිඤ්ඤා ගායනා ශෛලිය

(3) බටහිර ගායනා ශෛලිය (4) කර්ණාටක ගායනා ශෛලිය

39. පහත දැක්වෙන ගී අතුරින් හින්දි ගී තනු ඇසුරු කොටගෙන නිර්මාණය වූ ග්‍රැමෆෝන් ගීය කුමක් ද?

(1) මහ බෝධි මූලේ (2) දූඩිකළ මාතා

(3) සංසාර ගමනේ තණ්හා ආශා (4) ලප නොමවත් සඳ සේ

40. අට විසිමත් සේ ගීයක් වන්නේ,

(1) ගඟුලැලි ලා සිලිල සලා ගීතය

(2) පැහැසරණිය මිණි පැමිණිය ගීතය

(3) රූ රැසේ අඳිනා ලෙසේ ගීතය

(4) වරමාති සුභ චරිතේ ගීතය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**උපදෙස් :**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) i. තානම සහිත සේ ගී විශේෂයක් නම් කරන්න.

ii. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගී වර්ග දෙකක් නම් කරන්න.

iii. තබ්ලාවේ බායාවෙන් වයනු ලබන අක්ෂර දෙකක් නම් කරන්න.

iv. අපරදිග සංගීතයේ හි විකෘති ස්වර දැක්වීම සඳහා යොදන සංකේත දෙක නම් කරන්න.

v. දූලා නෙතුපුලා, රතදර සිරියා, ගල්ලෙන බිඳලා යන ගීත අයත්වන නාට්‍ය තුන පිළිවෙලින් නම් කරන්න.

vi. ශබීර් හුසේන් සහ හරි ප්‍රසාද් චෞරසියා යන සංගීතඥයින් ප්‍රසිද්ධ වූයේ කවර සංගීත භාණ්ඩ සඳහා ද?

vii. දේශීය මුහුණුවරක් ගත් පළමු චිත්‍රපටය කුමක් ද?

viii. නි̣ ස රි ස, මෙම ස්වර අභ්‍යාසය උච්ච සප්තකය දක්වා වර්ධනය කරන්න.

ix. | සං නි | ධ ප | ම ප | ධ ප | මෙම ස්වර පාදය අයත් වන තාලය නම් කරන්න.

x. නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ පියා ලෙස සැළකෙන්නේ කවුද?

(ලකුණු 02 × 10 = 20)

(02) පහත දැක්වෙන කරුණු නිවැරදිව වගු ගත කරන්න.

- භක්ති රසයෙන් යුත් මෙම රාගය ගායන වාදනයේදී කෝමළ ස්වර 4 ම යොදනු ලැබේ.
- ග ප..... ම ග ම රි..... ස..... මෙහි මුඛ්‍යාංගයයි.
- උත්තර භාරතීය සංගීතය හැදෑරීමේදී පළමුවෙන්ම පුහුණු කරණු ලබන ශුද්ධ ස්වරාත්මක රාගයකි.
- තීව්‍ර මධ්‍යමය යොදන සම්පූර්ණ ජාති රාගයකි.
- ස ස, රි රි, ග ග, ම ම, ප ...... විශේෂ සංගතියකි.
- සප්ජය හා පංචමය වාදී සංවාදී ලෙස යෙදේ.
- නි රි ග ම', ග රි ස, ප⁀රි, ග රි ස
- දිවා ප්‍රථම ප්‍රහාරයේ ගැයෙන රාගයකි.

i.


| බිලාවල් | කාෆි | යමන් | භෛරවී |
|---|---|---|---|
| | | | |

ii. ඉහත රාග අතරින් ඔබ කැමති රාගයක මධ්‍යලය ගීයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

iii. ඔබ ප්‍රස්තාර කළ මධ්‍යලය ගීයට ගැළපෙන හින්දුස්ථානි තාල පදය තාල සංඥා සහිතව නිවැරදිව ප්‍රස්තාර කරන්න. (ලකුණු 10)

(03) පහත දැක්වෙනුයේ සංගීත භාණ්ඩ වෙන් කර හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි බෙදුම් චක්‍රයකි.

තබ්ලාව, චෙලෝ, උඩැක්කිය, සන්තූර්, ගෙජ්ජි, ට්‍රම්පට්




i. A සිට F දක්වා ඒ ඒ ස්ථානයට සුදුසු සංගීත භාණ්ඩ නම් කරන්න.

ii. අක්ෂර නොමැති හිස් කොටු සඳහා ඔබ යෝජනා කරන සංගීත භාණ්ඩ 02 ක් ලියන්න.

iii. A අක්ෂයර සඳහා සුදුසු ඔබ කැමති සංගීත භාණ්ඩයක ස, රි, ග, ම, ප, ධ, නි යන ස්වර පිහිටන අයුරු රූප සටහනක දක්වන්න. (ලකුණු 10)

(04) පහත සඳහන් මාතෘක අතරින් මාතෘකා 03 ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i. සී. ද එස්. කුලතිලක මහතා

ii. ලයනල් රංවල මහතා

iii. ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා

iv. රෝහන බැද්දගේ මහතා (ලකුණු 10)

(05) එදා සමාජයේ තිබූ විවිධ නාට්‍ය ක්‍රම හා සංගීතය තුළ පැවැති වටිනාකම හා ප්‍රායෝගික බව පිළිබඳව දැනුම ලබා දීම සඳහා යන කණ්ඩායම් දෙක අතර පැවැති තරඟයකදී ලබාදුන් මාතෘකා පහත සඳහන් පරිදි විය.

A - නූර්ති සංගීතය තුළින් බිහි වූ අපගේ සංගීත කලාව.

B - නාඩගම් රංග ශෛලිය ආභාෂය කොටගත් අපගේ වේදිකා නාට්‍ය සම්ප්‍රදාය.

i. ඉහත සඳහන් මාතෘකා ඔස්සේ දැක්වීමට සුදුසු කරුණු 04 බැගින් වෙන් වෙන්ව ගෙන හැර දක්වන්න.

ii. ඉහත සඳහන් නාට්‍ය සම්ප්‍රදායන් දෙක සඳහා භාවිතා කරන ලද වාද්‍ය භාණ්ඩ වෙන් වෙන් ලෙස නම් කරන්න.

iii. ඉහත සඳහන් නාට්‍ය සම්ප්‍රදායන් දෙක සඳහා පාදක වූ ඉන්දියානු සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න. (ලකුණු 10)

(06) i. බටහිර සංගීතයේ එන පහත සඳහන් පාරිභාෂික පද උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

1. Tie Notes
2. Accidental
3. Ledger Line

ii. පහත සඳහන් ස්වර ප්‍රස්තාරය අපරදිග සංගීතයට පෙරලා ලියන්න.

+ගම / පග / මපධ / පග

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) (i) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත් කරන ස්වර ස්ථාපන ගී පාදයේ වචන හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමතය පරිදි නිර්දේශිත ස්වර ස්ථාපන ගීයක් ගායනා කළ හැක.) (ල.05)

(ii) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත්කරන ස්වර අභ්‍යාසයේ මුල් ස්වර හතර හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමත පරිදි ස ප ස්වර අතර සරල ස්වර අභ්‍යාසයක් 'ආ' කාරයෙන් ගායනය කරන්න.) (ල.05)

(iii) ගුරුවරයා වයනු ලබන නිර්දේශිත තබ්ලා පදය හඳුනාගෙන නම් කරන්න. (ල.05)

(iv) ගුරුවරයා ගයනු ලබන නූර්ති ගී / නාඩගම් ගී / නව නාට්‍ය ගී / ග්‍රැමෆෝන් ගී / සරළ ගී අතරින් එකක් පිළිබඳව ඔබ අසා ඇති තොරතුරු (මුල් ගායකයා / නාට්‍ය අධ්‍යක්ෂකයා / නාට්‍යයේ නම / සංගීතය) යන තොරතුරුවලින් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල.05)

(මුළු ලකුණු 20 යි.)

(02) විෂය නිර්දේශයට අයත් භෛරවී යමන් රාග අතරින් කැමති රාගයක සර්ගම් හෝ මධ්‍යලය ගීයක් පහත සඳහන් කරුණු ඇතුළත් වන සේ ගායනය හෝ වාදනය කරන්න.

- ආරෝහණ (ල.03)
- අවරෝහණ (ල.03)
- ස්ථායි (ල.07)
- අන්තරා (ල.07) (ල.20)

(03) ආඝාතාත්මක හෝ අනාඝාතාත්මක ජන ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.20)

(04) කපිරිඤ්ඤා ගී / චිත්‍රපට ගී / ග්‍රැමෆෝන් ගී වලින් එක් ගී වර්ගයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.20)

(05) (i) ගුරුවරයා නම් කරනු ලබන තාල පදයන් අතින් තාල දමා නිරූපණය කරන්න. (ජප් තාලය / ත්‍රිතාලය / දීප් චන්දි තාලය) (ල.05)

(ii) ස්වර පුවරු සංගීත භාණ්ඩයකින් මධ්‍යලය ගී / සර්ගම් ගී / නූර්ති ගී / නාඩගම් ගී / සරල ගී යන ගී වර්ග වලින් එක් ගී වර්ගයක අනු ගී වාදනය ඉදිරිපත් කරන්න. (ල.05)

(06) ස්වර වාද්‍ය භාණ්ඩයකින් මධ්‍යලය ගී / සරගම් ගී / නූර්ති ගී / නාඩගම් ගී / සරල ගී / ග්‍රැමෆෝන් ගී යන ගී වර්ග වලින් එකක් වාදනය කරන්න. (බටනලා, සිතාර්, වයලින්, දිල්රුබා ආදී ස්වර වාද්‍ය භාණ්ඩ.)

හෝ

තබ්ලාව වාදනය කරන්නේනම් කායදාවක් හෝ ෆේකාවක් වාදනය කරන්න. (ල.10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(4) | 5 -(1) | 6 -(1) | 7 -(4) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(1) | 12 -(2) | 13 -(3) | 14 -(1) | 15 -(3) | 16 -(3) | 17 -(4) | 18 -(2) | 19 -(1) | 20 -(3) |
| 21-(4) | 22 -(4) | 23 -(2) | 24 -(2) | 25 -(4) | 26 -(1) | 27 -(3) | 28 -(4) | 29 -(1) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(4) | 34 -(3) | 35 -(1) | 36 -(1) | 37 -(2) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) i. වන්නම්
ii. ගොයම් ගී හා පැල් ගී ආදී වශයෙන් ගී වර්ග දෙකක්.
iii. ගෙ, ක, කි
iv. (Sharp - Flat) (ෂාර්ප් ෆ්ලැට්)
v. මනමේ, කාලගෝල, සිංහබාහු
vi. තබ්ලාව හා බටනලාව
vii. රේඛාව
viii. නිසරිස, සරිගරි, රිගමග, ගමපම, මපධප, පධනිධ, ධනිසනි, නිසරිස
ix. ජජ් තාලය
x. සී. දොන් බස්තියන් ජයවීර (ලකුණු 02 × 10 = 20)

(02) i.

| බිලාවල් | කාෆි | යමන් | භෛරවී |
|---|---|---|---|
| • උත්තර භාරතීය සංගීතය හැදෑරීමේදී පළමුවෙන්ම පුහුණු කරනු ලබන ශුද්ධ ස්වරාත්මකන රාගයකි.<br>• ගප... මගමරි...ස | • සජ්ජය හා පංචමය වාදී සංවාදී ලෙස යෙදේ.<br>• සස රිරි ගග මම ප | • තීව්‍ර මධ්‍යමය යෙදෙන සම්පූර්ණ ජාතියේ රාගයකි.<br>• නි රි ග ම .... පරි | • දිවා ප්‍රථම ප්‍රහාරයේ ගායනා කරන රාගයකි.<br>• භක්ති රසයෙන් යුත් මෙම රාගය ගායනා වාදයේදී කෝමළ ස්වර 4 ම යොදනු ලැබේ. |


ii. නියමිත මධ්‍ය ලය ගීතය නිවැරදිව ප්‍රස්තාර කර තිබීම. (ලකුණු 04)

iii. ඉහත මධ්‍යලය ගීතයට අදාල තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කර තිබීම. (ලකුණු 02)


(03) i. A සන්තූර් B චෙලෝ C තබ්ලාව D උඩැක්කිය E ගෙජ්ජි F ට්‍රම්පට් (ල. 0.5 × 6 = 03)

ii. බටනලාව /හොරණෑව / සිම්බල් (ලකුණු 1 × 2 = 2)

iii. වයලීනය




සිතාරය




එකක් නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් (ලකුණු 05)

(04) දී ඇති මාතෘකා හතරෙන් දෙකකට ලකුණු 05 බැගින් ලකුණු 10 යි.

(05) i. <u>නූර්ති සංගීතය තුළින් බිහි වූ අපගේ සංගීත කලාව</u>

- නූර්ති සංගීතය හින්දුස්ථානි රාගධාරී සංගීතය හා උත්තර භාරතීය තාල ක්‍රමය පදනම් කරගනිමින් නිර්මාණය වී ඇත.
- නූර්ති සංගීතයෙන් අපට එක්වූ හින්දුස්ථානි තාල පද්ධතිය හා වාද්‍ය භාණ්ඩ අපගේ සංගීත කලාව තුළ භාවිතා වේ.
- නූර්ති ගී තුල තාලයෙන් බැහැරව ගයනු ලබන ගීත කොටසක් වන අතර නමින් දොහොරාව නමින් හැඳින්වේ. පසු කලෙක අපගේ සංගීත ක්ෂේත්‍රයට ද එක්විය. එය Adlib නමින් ව්‍යවහාරික සංගීතයේ දී යෙදේ.
- නූර්ති ගීයේ ස්ථායි අන්තරා ආකෘතිය දැකගත හැකිය. අපගේ සරල ගීයක නාදමාලාව ද කොටස් 02 ක් යටතේ නිර්මාණය වෙයි. එනම් Chorus හා Verse යනුවෙනි.

<u>නාඩගම් රංග ශෛලිය ආභාෂය</u>

- දෙබස් ගීතවත් අයුරින් ඉදිරිපත් කිරීම නාඩගම් සම්ප්‍රදායේ දැකිය හැක. මෙය අපගේ නාට්‍ය කලාව තුලද දැකිය හැකිවීම නාඩගම් නාට්‍ය තුලින් ලත් ආභාෂයකි.

  උදාහරණ : සිංහබාහු නාට්‍යය

  මා ප්‍රිය සොඳුර හා දරුවන් දෑසට හමුවන තුරු......

  මාගේ සැනසීමක් නැත.......
- චරිත ඉදිරිපත් කිරීමේ දී විවිධ ගමන් තාල භාවිතා කරනු ලැබීම නාඩගම් නාට්‍ය තුළ දැකිය හැකි අතර මෙය අපගේ නාට්‍ය තුලද දැකිය හැක.

  උදාහරණ : මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය
- පොතේ ගුරු චරිතය හා සහායට අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම අපගේ වේදික නාට්‍යය නාඩගම් නාට්‍යය තුළින් ලත් ආභාෂයකි.
- එක් එක් චරිතවලට ආවේණික මද්දල් පද හා අඩු / වැඩි ලෙස ලය භාවිතා කිරීම. (ලකුණු 06)

ii.
- නූර්ති සර්පිනාව, ඩෝලය, වයලීනය, තබ්ලාව
- නාඩගම් සර්පිනාව, හොරණෑව, මද්දලය (ලකුණු 1 × 2 = 2)

iii. නූර්ති උත්තර භාරතීය සංගීතය / හින්දුස්ථානි සංගීතය

නාඩගම් දක්ෂිණ භාරතීය සංගීතය / කර්ණාටක සංගීතය (ලකුණු 1 × 2 = 2)

එක් කෙටි සටහනකට ලකුණු 05 බැගින් ලබාදෙන්න.


(06) i.

1. Tie Notes : මෙම සංකේතය ආරම්භ වූ විභාගයේ මාත්‍රා ගණනත් ඊළඟ විභාගයේ ඇති මාත්‍රා ගණනත් දක්වා නොඩවා හඬ රඳා පවතින සේ ගායනය හෝ වාදනය කිරීම Tie සංකේතයෙන් අර්ථවත් වෙයි.

   උදාහරණ : ස / නිරි
2. Accidentals : අහඹු ලෙස ස්වර වල ඇතිවන වෙනස්කම් ලෙස හැඳින්වේ.

   උදාහරණ : තීව්‍ර ස්වර - Sharp # කෝමල - Flat - b ශුද්ධ ස්වර - Natural - #
3. Ledger Lines : අපරදිග ප්‍රස්ථාර ක්‍රමය ඉරි 05 ක් හෝ 10 ක් මත ගොඩ නැගෙන අතර ඉන් අමතරව ස්වරයක් ලිවීමට අවශ්‍ය වූ විට ඒ සඳහා අමතර ඉරි භාවිතා කෙරේ. එසේ යොදනු ලබන අමතර ඉරි Ledger lines ලෙස හැඳින්වේ.

උදාහරණ :




ii.

